සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

25A | S | I

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

# Second Term Test - Grade 12 - 2019

විභාග අංකය .............................

## ඉන්දියා ඉතිහාසය I

කාලය පැය එකයි

උපදෙස්

- මෙම කොටසේ ප්‍රශ්න 40 ක් ඇත. සියළු ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ එයින් එකක් පමණි. ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරාගත් පසු එය දක්වා ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
- I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු II කොටසේ පිළිතුරු පත් සමඟ අමුණා භාර දෙන්න.

- **අංක 01 සිට 10 තෙක් ඇති ප්‍රශ්න සඳහා නාම/ස්ථාන5 බැගින් දී ඇත. එයින් එකක් අනෙක් ඒවා සමග නොගළපේ. නොගැළපෙන පිළිතුර තෝරා ඊට හිමි අංකය වරහන තුළ ලියන්න.**

01. 1. ඍග් වේදය 2. අථර්වන් වේද 3. යජුර් වේද 4. ජාන්දෝන්‍ය 5. සාමවේද (.....)

02. 1. භාරත් දේශ් 2. භාරත වර්ෂ 3. හින්දුස්ථාන් 4. ජම්බුද්වීප 5. සප්ත සින්දු (.....)

03. 1. බ්‍රාහ්මණ 2. ක්ෂත්‍රිය 3. චණ්ඩාල 4. වෛශ්‍ය 5. ශුද්‍ර (.....)

04. 1. පුරු 2. යදු 3. තුර්වාස 4. අනු 5. ශිව (.....)

05. 1. තාමුලිප්ත 2. කල්‍යාණි 3. පාඨලීපුත්‍ර 4. භාරුකච්ච 5. සුප්පාරක (.....)

06. 1. හින්දුකුෂ් 2. නිල්ගිරි 3. සුලෙයිමාන් 4. කාවේරි 5. නිල්ගිරි (.....)

07. 1. සත්ලෙජ් 2. රාවි 3. බියස් 4. යමුනා 5. චේනබ් (.....)

08. 1. අංග 2. කාසි 3. වජ්ජි 4. මගධ 5. කෝසල (.....)

09. 1. ශ්‍රාවස්ති 2. සාංචි 3. කුසිනාරා 4. තක්ෂිලා 5. සාරානාත් (.....)

10. 1. නාසික් 2. අජන්තා 3. නාලන්දා 4. එල්ලෝරා 5. කාර්ලේ (.....)

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක් පද යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇතිවරහන තුළ ලියන්න.**

11. 1. ක්‍රිෂ්ණ - උජ්ජෙයිනි
    2. කාවේරි - තංජෝර්
    3. නර්මදා - භාරුකච්ඡ
    4 ගංගා - තාමුලිප්ත
    5. යමුනා - මථුරා (.....)

12. 1. අග්නි - ගින්නට අධිපති දෙවියා
2. ඉන්ද්‍ර - යුද්ධයට අධිපති දෙවියා
3. බ්‍රහ්ම - දේශගුණයට අධිපති දෙවියා
4. යම - මරණයට අධිපති දෙවියා
5. කුවේර - ධනයට අධිපති දෙවියා (.....)

13. 1. මස්කි සෙල්ලිපිය - අශෝක
2. හිටරි සෙල්ලිපිය - ස්කන්ධ ගුප්ත
3. ගාන්ධාර සෙල්ලිපිය - කණිෂ්ක
4. අයිහෝල් සෙල්ලිපිය - 11 පුලකේෂීන්
5. හතිගුම්පා සෙල්ලිපිය - ඛාරවේල (.....)

14. 1. කපිලවස්තු - ශාක්‍යයෝ
2. කේශපුත්ත - කාලාමවරු
3. මිථිලා - බූලියවරු
4. රාමගාම - කොලියයෝ
5. සුංසුමාරගිරියේ - භග්ගවරු (.....)

15. 1. පුරුෂපුර - පෙෂාවෝර්
2. පාඨලීපුත්‍ර - පැට්නා
3. ප්‍රයාග - අලහබාද්
4. වාතාපි - අයිහෝල්
5. ඉන්ද්‍රප්‍රස්ථ - දිල්ලිය (.....)

- **අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම/ප්‍රකාශන/දින වකවානු සමූහයක් X හා Y තීරුවල දී ඇත. Y තීරුවේ දී ඇති නාම/දින වකවානු X තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත්ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිලිවෙළට නොවේ. Y කීරුව, X තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දැක්වෙන සංයෝග පහෙන් එකක් නිවැරදිය. නිවැරදි සංයෝගයට අයත් අංකය තෝරා වරහන තුළ ලියන්න.**

| | X | | Y |
|---|---|---|---|
| 16. | 1. සෝම | A | පරිපාලන ඒකකයකි. |
| | 2. නිෂ්ක | B | ශුද්ධ වූ පානයකි. |
| | 3. කුල | C | බලකොටු නගරය. |
| | 4. පුර් | D | පවුල |
| | 5. රාෂ්ට්‍ර | E | පැරණි රන් කාසි වර්ගයකි. |

1. BEDCA 2. ADCBE 3. BEDCA 4. DABEC 5. ECBAD (.....)

| | X | | Y |
|---|---|---|---|
| 17. | 1. චතුර්වේද | A | ඍග්, යජුර්, සාම, අථර්වන් |
| | 2. චතුර්වර්ණ | B | දුක්ඛ, සමුදය, නිරෝධ, මාර්ග |
| | 3. චතුර් ආශ්‍රම | C | බ්‍රහ්මචාරී, ගෘහස්ථ, වානප්‍රස්ථ, සන්‍යාසි |
| | 4. චතුර් සත්‍යය | D | බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර |
| | 5. චතුර් උපායමාර්ග | E | සාම, දාන, භේද, දණ්ඩ |

1. ADCBE 2. BEDCA 3. CAEDB 4. DBAEC 5. ECBAD (.....)

| | X | | Y |
|---|---|---|---|
| 18. | 1. භාරුකච්ඡ | A | යමුනා |
| | 2. ඉන්ද්‍රප්‍රස්ථ | B | කාවේරි |
| | 3. බාරාණසි | C | නර්මදා |
| | 4. තංජෝර් | D | ගෝධාවරී |
| | 5. ප්‍රතිෂ්ඨාන | E | ගංගා |

1. ACDBE 2. BACDE 3. CAEBD 4. DACEB 5. EBACD (.....)

| | X | | Y |
|---|---|---|---|
| 19. | 1. පාඨලී පුත්‍ර | A | සොපාරා |
| | 2. ඉන්ද්‍රප්‍රස්ථ | B | පැට්නා |
| | 3. සුප්පාරක | C | දිල්ලිය |
| | 4. භාරුකච්ච | D | සෞරාෂ්ට්‍රය |
| | 5. කතියවාරය | E | බ්‍රෝච් |

1. ABDCE 2. BCAED 3. CABDE 4. DBEAC 5. EDBAC (.....)

| | X | | Y |
|---|---|---|---|
| 20. | 1. නාලන්දා | A | මහායාන මධ්‍යස්ථානය |
| | 2. නාගර්ජුන කොණ්ඩ | B | අශෝක ශිලා ලේඛනයකි. |
| | 3. සාරානාත් | C | බෞද්ධ අධ්‍යාපන මධ්‍යස්ථානයකි. |
| | 4. ගිර්නාර් | D | ජනපදයකි. |
| | 5. අංග | E | ස්ථූපයකි. |

1. ABCDE 2. BACDE 3. CAEBD 4. DABCE 5. EDCBA (.....)

- **අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකට ගැළපෙන පිළිතුර තෝරා, ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

21. ඉන්දු නිම්න ශිෂ්ඨාචාරය හා වෙළඳ සබඳතා පැවැත්වූ බවට සාධක ලැබෙන සමකාලීන ශිෂ්ඨාචාරය කුමක්ද?
1. චීන ශිෂ්ටාචාරය 2. මෙසපොතේමියානු ශිෂ්ටාචාරය 3. රෝම ශිෂ්ටාචාරය
4. මිසර ශිෂ්ටාචාරය 5. මායා ශිෂ්ටාචාරය (.....)

22. ඍග්වේදයෙහි පුරන්දර නමින් සඳහන් වන දෙවියා ඍග්වේද යුගයේ සහ පසුකාලීන ව වඩා ප්‍රචලිත ලෙස හඳුන්වන ලද්දේ පහත දැක්වෙන කුමන නමින්ද?
1. කුවේර 2. යම 3. පශුපති 4. ඉන්ද්‍ර 5. වරුණ (.....)

23. කැම්බේ බොක්කට ඇළ මාර්ගයකින් සම්බන්ධ වූ හරප්පා වරාය නම් කරන්න.
1. චන්හුදාරෝ 2. ලෝතාල් 3. කලිබංගන් 4. කොට්ඩිජී 5.සුක්තජොන්දෝර් (.....)

24. ඉන්දියාවේ වයඹ දිග ප්‍රදේශයේ කාබුල් නදී නිම්නයේ සිට පෙෂාවෝර් නගරය දක්වා වැටී ඇති දුර්ග මාර්ගය වන්නේ,
1. ඛයිබර් 2. බෝලාන් 3. මක්‍රාන් 4. බැරෝඩා 5. හේරාත් (.....)

25. ලිච්ඡවි ගණ රාජ්‍යයේ අගනුවර වූයේ කුමක්ද?
1. කුසිනාරා 2. වෛසාලී 3. මිථිලා 4. සාකේත 5. පාවා (.....)

- **අංක 26 - 30 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු 5 බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

26. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ විනාශයට මුල් වූ හේතු.
1. රාම් ගඟේ ගමන් මාර්ගය වෙනස් වීම. 2. දැඩි හා නිරන්තර ගංවතුර
3. ථාර් කාන්තාරය දෙසින් පැමිණි වැලි කුණාටු. 4. බාහිර ආක්‍රමණිකයන්ගේ ප්‍රහාර
5. ජනගහන වර්ධනය (.....)

27. ඉන්දියාවේ පුරා විද්‍යාත්මක මූලාශ්‍රයක් වන කාසි,
1. හස් එබූ කාසි වර්ගය කහාපන නමින් හැඳින්වේ.
2. ලෝහයෙන් තනා ඇති කාසිවල විවිධ සංකේත ඇත.
3. ගුප්තයන් විසින් උසස් තත්වයේ කාසි නිකුත් කරන ලදී.
4. සාතවාහන පාලකයෝ කාසි නිකුත් නොකළහ.
5. බැක්ට්‍රියානු ග්‍රීකයන් විසින් නිකුත් කරන ලද කාසි වයඹදිග ඉන්දියාවෙන් බහුලව හමු වී ඇත. (.....)

28. පශ්චාත් වෛදික යුගය,
   1. අධ්‍යාපනය, බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය හා වෛශ්‍යයන්ට පමණක් සීමා විය.
   2. වර්ණ ක්‍රමය පෙර අවධියට වඩා දැඩි එකක් විය.
   3. බ්‍රාහ්මණයන්ගේ ජීවිතය ආශ්‍රම හතරකට බෙදන ලදී.
   4. වේදය ඉගැන්වීමට අවසර තිබුණේ බ්‍රාහ්මණයන්ට හා වෛශ්‍යයන්ට පමණි.
   5. වෛදික යුගයට වඩා කාන්තාවය අඩු ගෞරවයක් හිමිවිය. (.....)

29. ක්‍රි.පූ. 6 වන සියවසේ ගණ රාජ්‍ය,
   1. සභාවක් පැවැත්වීම සඳහා ගණ පූරණයක් අවශ්‍ය විය.
   2. තීරණ ගනු ලැබූයේ බහුතර ඡන්දයෙනි.
   3. ගණ රාජ්‍ය නායකයා අධිරාජයා ලෙස හැඳින්විය.
   4. අධිකරණ හා පරිපාලන කටයුතු මෙහෙයවන ලද්දේ සභා විසිනි.
   5. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් ගෙනයන ලදී. (.....)

30. මගධයේ නැගීමට මුල් වූ සාධක,
   1. ධෛර්ය සම්පන්න රජුන් බලයට පැමිණීම.
   2. ආරක්ෂිත අගනුවරක් වීම.
   3. නම්‍යශීලී සමාජ පසුබිම.
   4. විවිධ ස්වාභාවික සම්පත් බහුලව ලැබීම.
   5. චණ්ඩපජ්ජෝත රජු විසින් දමනලද අඩිතාලම. (.....)

- **අංක 31 සිට 35 දක්වා ප්‍රශ්නවලට දක්වා ඇති ප්‍රතිචාර අතරින් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,**

  A සහ B පමණක් නිවැරදිනම් 1 ද,
  B සහ C පමණක් නිවැරදි නම් 2 ද,
  C සහ D පමණක් නිවැරදි නම් 3 ද,
  A සහ C පමණක් නිවැරදිනම් 4 ද,
  ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිනම් 5 ද වරහන තුළ ලියන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| A සහ B පමණක් නිවැරදිය. | B සහ C පමණක් නිවැරදිය. | C සහ D පමණක් නිවැරදිය. | Aහා C පමණක් නිවැරදිය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැදිය. |

31. ඉන්දියාවේ ආර්ය ව්‍යාප්තිය,
   (A) ආරම්භයේදී ආර්යයෝ සප්ත සින්දු ප්‍රදේශයේ පදිංචි වූහ.
   (B) පසුව ඔවුහු ගංගා - යමුනා නිම්නයට ව්‍යාප්ත වූහ.
   (C) වෛදික යුගයේ මුල් අවධියේදී වින්ධ්‍යාව තරණය කළ ආර්යයෝ දකුණෙහි පදිංචි වූහ.
   (D) ආර්යා වර්තයේ ආර්ය ව්‍යාප්තියෙහිලා දාසවරු වැදගත් භූමිකාවක් ඉටු කළහ. (.....)

32. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අනුව,
   (A) මෙහි පැවතියේ ප්‍රභූ පන්තියේ පාලනයක් බවට අදහස් ඉදිරිපත් වී ඇත.
   (B) මෙම ශිෂ්ටාචාරය ව්‍යාප්තව පැවති ප්‍රදේශය වර්තමානයේ පාකිස්ථානයට අයත්ය.
   (C) මාතෘ මූලික සමාජයක් තිබීම.
   (D) ආර්ථිකයේ වැදගත් වූයේ කර්මාන්ත පමණි. (....)

33. සොළොස් මහා ජනපදවලට අදාළව,
   (A) සමූහාණ්ඩු ලෙස සැකසුණු රාජ්‍යයන්ද විය.
   (B) ගණ රාජ්‍ය ලෙස හැඳින්වූයේ රාජාණ්ඩුවයි.
   (C) රාජාණ්ඩු ක්‍රම බොහෝ විට බිහිවූයේ ගංගා නදී නිම්නය අසලය.
   (D) සමූහාණ්ඩු ඇතිවූයේ සිය ගෝත්‍රික අනන්‍යතාවය රැක ගැනීමට අකමැති පිරිස් සිටි ප්‍රදේශවලය. (.....)

34. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ නාගරික සැලසුම්,
   (A) ඉන්දු නිම්න ශිෂ්ටාචාරය වෙනත් ශිෂ්ටාචාර සමග සබඳතා පවත්වා නොමැති බව.
   (B) ප්‍රධාන වාණිජ නගරය මෙන්ම පරිපාලන නගරය රබීගාර් වීම.
   (C) මොහෙන්ජොදාරෝ සහ හරප්පා යන නගර ශිෂ්ටාචාරයේ ප්‍රධාන නගර දෙක වීම.
   (D) නයිල් ශිෂ්ටාචාරයෙන් හරප්පා සභ්‍යත්වයට අයත් මුද්‍රා හමුවීම. (.....)

35. පශ්චාත් වෛදික යුගයේ ආගමික තත්වය,
   (A) පශ්චාත් වෛදික යුගයේදී බහුදේව වාදය ස්ථාපිත විය.
   (B) ඍග් වෛදික යුගයේ මෙන් සරල යාග පැවැත්විණි.
   (C) විෂ්ණු, ඊශ්වර, බ්‍රහ්ම යන දෙවිවරුන් (ත්‍රි මූර්ති) ජනප්‍රිය සංකල්පයන් බවට පත්වීම.
   (D) ඍග් වෛදික යුගයේ පැවති බහුදේව වාදය වෙනුවට ඒක දේවවාදය ස්ථාපිත විය. (.....)

- **අංක 36 සිට 40 දක්වා තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 හා 5 වන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.**

| පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|
| 1. නිවැරදිය | නිවැරදිය |
| 2. නිවැරදිය | නිවැරදිය |
| 3. වැරදිය | වැරදිය |
| 4. වැරදිය | නිවැරදිය |
| 5. නිවැරදිය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදාදෙයි. |

| පළමු වැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|
| 36. ඍග් වෛදික ජනයා බහුදේව වාදී සංකල්පය අදහන ලදී. | පශ්චාත් වෛදික ජනයා ඒක දේවවාදී සංකල්පය අදහන ලදී. (.....) |
| 37. ඉන්දු නිම්න ශිෂ්ටාචාරය පුරාම ඒකීය භාවයක් දක්නට තිබිණි. | එම ඒකීයභාවයට මූලික වශයෙන් හේතු වී ඇත්තේ බලවත් රජෙකු යටතේ මධ්‍යගත පාලනයක් නොපැවතීමයි. (.....) |
| 38. භාරතයන්ගේ සටන පිළිබඳ තොරතුරු දැක්වෙන වෘත්තාන්තය මහා වංශයයි. | මෙම සටන සිදුවූයේ නර්මදා නදිය ආසන්නයේ ය. (.....) |
| 39. ක්‍රි.පූ. 5 වන සියවස තුළ ඉන්දියාවේ කැපී පෙනෙන මානසික හා අධ්‍යාත්මික පිබිදීමක් පැවතියේය. | මගධය මෙම ප්‍රබෝධකාරී තත්වයේ කේන්ද්‍රස්ථානය විය. (.....) |
| 40. පාඨලීපුත්‍රයේ නගර පාලනය පිළිබඳ දීර්ඝ විස්තරයක් මෙගස්තීනිස් විස්තර කරයි. | නගරයේ පාලන කටයුතු මණ්ඩල හයකට පවරා තිබුණු බවත් ඒ සෑම මණ්ඩලයක්ම සාමාජිකයින් පස් දෙනෙකුගෙන් සමන්විත වූ බවත් ඔහු සඳහන් කරයි. (.....) |

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved



දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

**Second Term Test - Grade 12 - 2019**

විභාග අංකය ............................ **ඉන්දියා ඉතිහාසය II** කාලය පැය දෙකයි

උපදෙස්

♦ පළමු ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

01. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

| | | | |
|---|---|---|---|
| 1. මක්‍රාන් දුර්ගය | 2. කෘෂ්ණා නදිය | 3. වින්ධ්‍යා කඳු | 4. තක්ෂිලා |
| 5. කාලිංගය | 6. සුප්පාරක | 7. මගධය | 8. හරප්පා |
| 9. තංජෝර් | 10. වෛශාලි | 11. මදුරෙයි | 12. කැම්බෙ බොක්ක |

(ල. 12)

02. ඉන්දියා ඉතිහාසය ගොඩනැගීමේදී දේශීය සාහිත්‍ය මූලාශ්‍රවලින් ලැබෙන පිටිවහල ප්‍රමාණ කරන්න. (ල. 16)

03. ඍග් වෛදික ආර්යයන්ගේ දේශපාලන ආර්ථික හා සමාජීය ජීවිතය විස්තර කරන්න. (ල. 16)

04. වෛදික යුගයේදී ඉන්දියාවේ ආර්‍ය ජනාවාස පිහිටුවීම හා ඒවායේ ව්‍යාප්තිය විස්තර කරන්න. (ල. 16)

05. හරප්පා ශිෂ්ටාචාරය පුරාතන ලෝකයේ ඉතා දියුණුම සභ්‍යත්වවලින් එකකි.
   (i) ඉන්දු නිම්න සභ්‍යත්වය පිළිබඳ කැණීම්වලට සම්බන්ධ වූ පුරාවිද්‍යාඥයින් දෙදෙනෙකු නම් කරන්න. (ල. 2)
   (ii) ඉන්දු නිම්න වැසියන්ගේ ආගමික විශ්වාස 2ක් දක්වන්න. (ල. 2)
   (iii) මෙම සභ්‍යත්වයේ වැදගත් මධ්‍යස්ථාන 4ක් නම් කරන්න. (ල. 4)
   (iv) හරප්පා ශිෂ්ටාචාරය ලෝකයේ ඉතා දියුණු සභ්‍යත්වයක් ලෙස කොතෙක් දුරට සැලකිය හැකිද? (ල. 8)

06. පශ්චාත් වෛදික යුගයේ සමාජ හා දේශපාලන ක්ෂේත්‍රවල දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න. (ල. 16)

07. ක්‍රි.පූ. 6 වන සියවසේ ඉන්දීය ඉතිහාසයේ පරිවර්තන යුගයකි.
   (i) මෙම සොළොස් මහා ජනපදවල ක්‍රියාත්මක වූ පාලන ක්‍රම 2ක් නම් කරන්න. (ල. 2)
   (ii) ගණ තන්ත්‍ර පාලනයක් පැවති රාජ්‍යයන් 2ක් සඳහන් කරන්න. (ල. 2)
   (iii) රාජාණ්ඩු පාලන ක්‍රමයේදී රජු සතුව පැවති බලතල 3ක් නම් කරන්න. (ල. 3)
   (iv) රාජාණ්ඩු පාලනය ප්‍රබ පැවති රාජ්‍යයන් 3ක් නම් කරන්න. (ල. 3)
   (v) ඉහත ප්‍රකාශය පරික්ෂා කරමින් උතුරු ඉන්දියාවේ දේශපාලන තත්වය විස්තර කරන්න. (ල. 6)

08. එක්කෝ (A) කොටසට නැතහොත් (B) කොටසට පමණක් පිළිතුරු සපයන්න.
   (A) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ආගමික විශ්වාස පිළිබඳ විස්තර කරන්න.
   (B) වයඹදිග කපොලු පැරණි ඉන්දියානු ඉතිහාසය කෙරෙහි බලපෑ අයුරු පැහැදිලි කරන්න.(ල. 16)


09. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම 2ක් පිළිබඳ ඓතිහාසික සටහන් ලියන්න.
   1. වෛදික ආර්යයන්ගේ ආගමික තත්වය
   2. ගණ රාජ්‍යවල පරිපාලන ක්‍රමය
   3. හරප්පා ශිෂ්ටාචාරයේ නගර සැලසුම්
   4. සිංදු ගංගා මිටියාවත. (එක් කොටසකට ලකුණු 8 බැගින් ලකුණු 16)

**දෙවන වාර පරීක්ෂණය 2019 - ඉන්දියා ඉතිහාසය.**
**පිළිතුරු 12 - ශ්‍රේණිය 1 කොටස**

| | | | |
|---|---|---|---|
| **01.** - 4 | **11.** - 1 | **21.** - 2 | **31.** - 5 |
| **02.** - 5 | **12.** - 3 | **22.** - 4 | **32.** - 1 |
| **03.** - 3 | **13.** - 3 | **23.** - 2 | **33.** - 4 |
| **04.** - 5 | **14.** - 3 | **24.** - 1 | **34.** - 2 |
| **05.** - 3 | **15.** - 4 | **25.** - 2 | **35.** - 3 |
| **06.** - 4 | **16.** - 3 | **26.** - 3 | **36.** - 2 |
| **07.** - 4 | **17.** - 1 | **27.** - 4 | **37.** - 1 |
| **08.** - 3 | **18.** - 3 | **28.** - 4 | **38.** - 3 |
| **09.** - 4 | **19.** - 2 | **29.** - 3 | **39.** - 4 |
| **10.** - 3 | **20.** - 3 | **30.** - 5 | **40.** - 5 |

(ලකුණු 40)

**<u>11 පත්‍රය - පිළිතුරු</u>**




02. ඉන්දියානු සාහිත්‍ය මූලාශ්‍ර වන,

| | | |
|---|---|---|
| * වෛදික සාහිත්‍යය | * ලෞකික මූලාශ්‍ර ග්‍රන්ථ | * නාට්‍ය ග්‍රන්ථ |
| * පුරාණ ග්‍රන්ථ | * ඓතිහාසික ග්‍රන්ථ | * ව්‍යාකරණ ග්‍රන්ථ |
| * බෞද්ධ ග්‍රන්ථ | * වෙනත් සාහිත්‍ය ග්‍රන්ථ | * කාව්‍ය ග්‍රන්ථ |
| * ජෛන සාහිත්‍ය | * සංගම් සාහිත්‍ය | * දේශපාලන න්‍යාය ග්‍රන්ථ |
| * වෙනත් න්‍යාය ග්‍රන්ථ | * වීර කාව්‍ය/රාමායනය/මහා භාරතය | |

ආදී ග්‍රන්ථ පිළිබඳ විස්තර කරන්න. (ල. 16)

03. දේශපාලන ඃ

* ගෝත්‍රික කණ්ඩායම් වශයෙන් ජනාවාස ආරම්භ වීම.
* රාජ්‍යනායක යන පොදු නාමයෙන් ගෝත්‍ර නායකයා හැඳින්වීය.
* බලවත් ගෝත්‍ර හා කුඩා ගෝත්‍ර ගණනාවක් පිළිබඳව සඳහන් වීම.
* බලවත් ගෝත්‍ර - භරත, පුරු, යදු, තුර්වාශ, අනු, දතාසු
  කුඩා ගෝත්‍ර - අලීන, පක්ෂ, බහලානාස්, ශිව, විශාති
* එකිනෙක ගෝත්‍ර අතර බල අරගල ඇති වී ජය ගන්නවුන් බලවත් වීම.
* භරත ගෝත්‍රයේ රාජන් වූ ඡුදාස්ට එරෙහිව වෙනත් ගෝත්‍ර 10ක් සටනට පැමිණීම.
* වෛදික ගීතිකාවල මෙය දස රාඥ යුද්ධය ලෙස හඳුන්වා තිබීම.
* ඍග් වෛදික පාලන ඒකක ගම්, විශ්, ජන යන පාලන ඒකකවලට බෙදා තිබීම.
* සමිති හා සභා යනුවෙන් මණ්ඩල 2ක් පාලනයේදී වැදගත් වීම.
* රාජ්‍ය පාලනයට සහභාගී වූ නිලධාරීන් හා ඔවුන්ට අයත් කාර්යයන් රැසක් පිළිබඳ සටහන් වීම.
* රාජ්‍ය පාලන කටයුතු මනාව පවත්වාගෙන යාමේදී 'චාර' නම් වූ චරපුරුෂ සේවාවක් පවත්වාගෙන යාම.
* රටේ නීතිය හා සම්ප්‍රදාය 'ධර්මන්' දඬුවම 'දණ්ඩ' ලෙසත් හඳුන්වා දීම.

**ආර්ථික ඃ**

* කෘෂි කර්මාන්තය පදනම් කොටගත් ග්‍රාමීය කෘෂි ආර්ථිකයක් පැවතීම.
* කෘෂි කටයුතුවලට ජලය ලබා ගැනීමට වාරි ක්‍රම භාවිතා කළ බව.
* සත්ත්ව පාලනයට වැදගත් තැනක් ලැබීම.
* ගවයින් කෘෂි කටයුතුවලට විශාලදායකත්වයක් ලබාදීම.
* භාණ්ඩ හුවමාරු කරගත් වාණිජ රටාවක් පවත්වා ගෙන යාම.
* ගොඩබිම් මාර්ග මෙන්ම ගංගා මාර්ගද ප්‍රවාහනයසඳහා යොදා ගැනීම.
* ඍග් වේදයෙහි සමුද්‍ර යන්න සඳහන් වී තිබීමෙන් ඔවුන් මුහුද ගැන දැන සිටීම.
* විදේශ වෙළඳාම පැවති බව, වාණිජ සම්බන්ධතා තිබූ බව.

**සමාජ ඃ**

* ගෝත්‍රික හා සමාජ ලක්ෂණ වලින් යුක්ත සමාජයක් පැවතීම.* පීතෘ මූලික සමාජයක් පැවතීම. * පුතුන්ගේ ඉපදීම වඩාත් අගය කිරීම.* බහු ස්ත්‍රී සේවනය පැවති බව. * ළමා විවාහ නොපැවතීම.* වැන්දඹු ස්ත්‍රියට යළි විවාහ වීමට අයිතිය පැවතීම.* ආගමික කටයුතුවලට ස්වාමියා හා සමානව සහභාගිවීමට ස්ත්‍රියට හැකිවීම.
* පැහැදිලි වර්ණ භේදයක් නොවුවද ආර්ය හා අනාර්ය භේදයක් දක්නට ලැබීම.
* කිරි, ගිතෙල්, පළතුරු, තිරිඟු, බාර්ලි සහ ධාන්‍ය වර්ග ප්‍රධාන ආහාර ලෙසත් විශේෂ අවස්ථාවලදී මස් මාංශ අනුභවකිරීම.*සුරාව පැවති අතර උත්සව අවස්ථාවල සෝම යුෂ පානයකිරීම.
* කොටස් 4කින් යුත් චාම් ඇඳුමක් දක්නට ලැබීම. * ලෝම, කපු, මුවහම් ආදියෙන් වස්ත්‍ර සැකසීම.
* පිරිමින් හිස් ආවරණය කර සිටීම.* ස්ත්‍රී පුරුෂ දෙපක්ෂම ආභරණ පැළඳීම ආදිය විස්තර කරන්න. (ලකුණු 16)

04. * ආර්යයන් මුලින්ම සප්ත සින්ධු ප්‍රදේශයේ පදිංචි වීම.

* සප්ත සින්ධු යනු ජේලම්, චේනාබ්, රාවි, බියස්, සත්ලෙජ්, සරස්වතී, දෘෂද්වතී යන ගංගා හතෙන් සමන්විත වූ ප්‍රදේශය බව.
* මෙයින් සරස්වතී හා දෘෂද්වතී යන ගංගා 2 සිඳී ගියපසු එම ප්‍රදේශය ගංගා පහේ රට හෙවත් පංජාබ් යනුවෙන් හැඳින්වීම.
* භරත ගෝත්‍රයේ සුදාස් රජු රාවි, සත්ලෙජ් යන ගංගා අතර ලැගුම්ගෙන සිටි ගෝත්‍ර දහයක් සමග දසරාඥ නම් යුද්ධයකට පිවිසීම.
* අනු, පුරු, යදු, තුර්වාශ, ඍචි, වැනි ගෝත්‍රිකයන් රාවි, සත්ලෙජ් ගංගා අතර ප්‍රදේශයේ ව්‍යාප්ත වී සිටි බව.
* ඍග්වේදයේ අනාවරණය වන තොරතුරු අනුව වෛදික ආර්යයන් අෆ්ගනිස්ථානය, පංජාබය, සින්දු ප්‍රදේශයේ කොටස්, රාජ්පුත්‍රාවේ හා ඉන්දියාවේ වයඹ දිග දේශ සීමාව, කාශ්මීරය, නැගෙනහිර සරසු නදිය යන ප්‍රදේශවල ව්‍යාප්තව සිටි බව.
* මෙම යුගය කොටස් දෙකකට බෙදීම.
* ඍග් වෛදික යුගය - ඍග් වේදයෙන් තොරතුරු ලැබෙන යුගය.
  පශ්චාත් වෛදික යුගය - යජුර්, සාම, අථර්වන්, බ්‍රාහ්මණ, අරන්‍යක, උපනිශද් , පුරාණ වේදාංග උපවේද සූත්‍ර ආදියෙන් තොරතුරු ලැබෙන යුගය. ආදිය විස්තර කරන්න.

05. (i) මෝටිමර් වීලර්, ජෝන් මාර්ෂල්, දයාරාම්ශානි, රායිබහදූර්, ආර්.ඩී. බැනර්ජි, අර්නස්ට් ජේ. මැකේ, එම්.එස්. වත්ස්, කනිංහැම්, ග්ලීන්, ඩැනියෙල්, ෆෙයාපර්විස්, සෝෂ්. (ල. 2)

(ii) පශුපති ඇදහීම, මාතෘ දෙවඟන ඇදහීම, ලිංග හා යෝනි වන්දනය, සත්ව වන්දනය, වෘක්ෂ වන්දනය, ජල වන්දනය, ගිනි දෙවියන් පිදීම, සූර්ය දේව වර්ධනය, යන්ත්‍ර මන්ත්‍ර බිළි පූජා බිලිදීම, මළවුන් පිදීම. (ල. 2)

(iii) මොහෙන්ජොදාරෝ, හරප්පා, චංහුදාරෝ, ලෝතාල්, කලිබන්ගන්, ඩොලවීරා, ආම්රි, ජුදෙයිරොදාරෝ, දාබර් කොට්, සුක්තජොන්දෝර්, සන්දන් වාලා, කොට්ඩිජි, දෙසල් පාර්, අලම්ගිර්පුර්, රූපාර්. (ල. 4)

(iv) * ලෝකයේ ඉපැරණි ගංගා නිම්න ශිෂ්ටාචාර අතරින් අති විශිෂ්ඨ ස්ථානයක් ලැබීම.

* දියුණු ශිෂ්ටාචාරයක පැවතිය යුතු අංග වන නගර, වෙළඳම, කෘෂිකර්මය. කර්මාන්ත, නිවාස, ඇඳුම් පැළඳුම් ආදිය මෙහි ඉතා දියුණු මට්ටමක තිබුණු බවට සාධක හමුවීම.
* එහි උසස් සංස්කෘතියක් තිබූ බව.
* ඉන්දු නිම්න ශිෂ්ටාචාරය මුළුමනින්ම නාගරික ලක්ෂණ වලින් යුක්ත වීම.
* එහි ක්‍රමානුකූල සැලසුම්කරණයක් තිබීම. මොහෙන්ජොදාරෝ සහ හරප්පා මෙහි විශාලම නගර 2 වීම. අළුතෙන් සොයාගත් නගරය රඛිගාර් වීම.
* නගරය ඇතුළු නුවර හා පිටිනුවර වශයෙන් කොටස් 2කට තිබූ බව.
* නගරයට පිවිසීමට විශාල දොරටු හා කොටු පවුර මත මුර අට්ටාල තිබීම.
* සෑම නිවසකම ළිඳක්ද, වීදිය පැත්තට වන්නට නාන කාමරයක් තිබීම.
* ගඩොලින් නිමකරතිබූ එම නාන කාමරවල ජලය වීදියේ කාණු වලට ගලායාම සඳහා සිරස් දිසා බස්නාවක් ගඩොලින් තනා තිබීම.
* සමකාලීන හෝ ආසන්න කාලයක වෙනත් ශිෂ්ටාචාරයක දැකිය නොහැකි තරම්ය.
* නා නා හැඩයට කපා පුළුස්සා ගත් ගඩොල් වර්ග ඉන්දු නිම්නය පුරා භාවිතා කර ඇත. කාණු බැඳීමට අවතල හා උත්තල නැම්වලින් යුත් ගඩොල් භාවිත කර ඇත.
* මංමාවත් ඉතාමත් සැලසුම් සහගත ලෙස නිර්මාණය කර තිබීම.
* නගරයට ඇතුළුවන උතුරු දකුණු මහවීදි රෝද යෙදූ වාහනවලට මෙන්ම පයින් ගමන් කරන්නන්ටද ඉඩතඩ ඇති තරම් විශාලය.
* මැද මිදුලක් සහිත නිවාස.
* ලේඛන කලාව දියුණු ශිෂ්ටාචාරයක ලක්ෂණ පැවතීම.
* වෙළඳ කටයුතුදියුණුව පැවතීම.... ආදී ලෙස විස්තර කරන්න. (ල. 8)

06. **<u>පශ්චාත් වෛදික යුගයේ සමාජ :</u>**
* නිත්‍ය රාජ්‍යත්වයක් බිහිවීම. * සමාජ බෙදීමක් වශයෙන් වර්ණ භේදය ස්ථාපිත වීම.
* මෙම යුගයේදී වර්ණ භේදය කුළ ක්‍රමයක් කරා වර්ධනය වීම. * ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, වෛශ්‍ය,ශුද්‍ර යනුවෙන් හැම කුලයකටම නිශ්චිත වෘත්තීන් තිබීම. * හැම කුලයකටම සමාජයේ ඉහළ හෝ පහළ නිශ්චිත තත්වයක් තිබීම.
* අයිතිවාසිකම් හා වරප්‍රසාද තිබීම. * එය පහළ කුලවලට බලපෑමක් නැත. ආදී ලෙස විස්තර කරන්න.

**<u>දේශපාලන :</u>**
* රාජ්‍යත්වය දේව නිර්මාණයක් ලෙස පිළිගැනීම.
* රාජ්‍යත්වය තහවුරු කිරීම සඳහා විවිධ යාඥා කළ බව, ශතපථ බ්‍රාහ්මණයෙහි හා ඓතරේය බ්‍රාහ්මණයෙහි ඒ බව සඳහන් වීම.
* බොහෝ රජවරු බලය තහවුරු කර ගැනීම සඳහා සංඥා කිරීම විශාල අධිරාජයයක් හිමිකර ගැනීමට අශ්ව මේධ යාග පැවැත්වීම, එය සංකේතවත් කිරීමට පසු කාලයේ ගල් අශ්ව රූප පවා නෙලීම, අශ්වයකු සරසා විශාල උත්සවයක් පවත්වා අශ්වයා මරා එම ලේ ගින්නට පිදීමෙන් රාජ්‍යත්වය තහවුරු වන බව.
* මෙම යුද්ධ නිසා දුර්වල ගෝත්‍ර යටපත් වෙමින් ප්‍රබල ගෝත්‍ර ඉස්මතුවීමක් දක්නට ලැබේ.
* රාජ්‍ය ඉසිලූ රජවරුන් විවිධ විරුද නම්වලින් හැඳින්වීම. යුද්ධයකදී රජු මියගියහොත් රාෂ්ට්‍ර හෝ විශ් යන ප්‍රදේශවල ජනයා විසින් රජකම සඳහා රාජන්‍ය හෙවත් රජ පවුලේ කුමාරවරුන් අතරින් වඩා සුදුස්සා තෝරා ගත් අවස්ථාද තිබිණි.
* රජුගේ පාලනය සාර්ථක කරගැනීම සඳහා සමිති හා සභා යන ආයතන 2ක් පැවතීම... ආදී ලෙස විස්තර කරන්න. (ල. 16)

07. 1. රාජාණ්ඩු පාලන ක්‍රමය 2. සමූහාණ්ඩු පාලන ක්‍රමය (ල. 2)
2. වජ්ජි සහ මල්ල (ල. 2)
3. විධායක/ව්‍යවස්ථාදායක/අධිකරණ (ල. 3)
4. මගධ/කෝසල/වත්ස/අවන්ති
5. * ඉන්දියාවේ ක්‍රි.පූ. 6 වන සියවස වන විට බෞද්ධ සාහිත්‍යයේ තොරතුරු වලින් උතුරු ඉන්දියාවේ සොළොස් මහා ජනපද නම් වූ රාජ්‍ය 16ක් ගැන සඳහන් වේ. එය ගෝත්‍රික ආධිපත්‍යයෙන් මිදුණු උත්තර භාරතීය සමාජය රජුන් මුල් කරගත් රාජාණ්ඩු ක්‍රමයක් කරා ගමන් කළ කාල පරිච්ඡේදයකි. සූත්‍ර පිටකයේ අංගුත්තර නිකායේ මේ පිළිබඳව සඳහන් වීම.
* අංග , මගධ, කාසි, කෝසල... ආදී ලෙස සොළාස් මහා ජනපද නම් කිරීම.
* මේ ජනපද පිළිබඳ තොරතුරු ලබාදෙන මූලාශ්‍ර ලෙස බ්‍රාහ්මණ, ජෛන හා බෞද්ධ ග්‍රන්ථ දැක්විය හැකිය. මෙම ජනපදවල පාලන ක්‍රම දෙයාකාර වේ. රාජාණ්ඩු පාලනය හා සමූහාණ්ඩු පාලනය වේ.
* සීහනාද හා මහා සුදස්සන සූත්‍රවල රාජාණ්ඩු පාලන ක්‍රමවල ලක්ෂණ දක්වා තිබීම.
* සක්විති රජෙකුගේ ලක්ෂණ දක්වා තිබීම. * ප්‍රධාන රාජාණ්ඩු 4ක් දක්නට ලැබීම.
* සමූහාණ්ඩු පාලන ක්‍රමය සහ ඒවායේ ලක්ෂණ හඳුන්වා දීම. එවැනි සමූහාණ්ඩු 9ක් පිළිබඳ සඳහන් වීම ...ආදී ලෙස විස්තර කිරීම. (ල. 6)

08. (A) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ විවිධ ආගමික මති මතාන්තර තිබුණි. කැණීම්වලින් සොයාගත් නටඹුන් එයට සාක්ෂි දරයි.
* ජගත් මාතා හෙවත් මව් දෙවඟන වැඳීම. * පුරුෂ වන්දනය * වෘක්ෂ වන්දනය
* සත්ව වන්දනය* ජල වන්දනය* ලිංග වන්දනය * යෝනි වන්දනය* ගිනි දෙවියන් පිදීම.* මළවුන් පිදීම
* සූර්ය දෙවියා පිදීම. * අං පිදීම ආදී ආගමික විශ්වාස විස්තර කරන්න. (ල. 16)

(B) ඉන්දියාවේ වයඹ දිග කපොලු පැරණි ඉන්දීය ඉතිහාසයේ කැපී පෙනෙන ලක්ෂණ අතරින් කපොලු 4ක්හඳුනාගත හැකිය.

1. ඛයිබර් දූර්ගය - කාබුල් නදී නිම්නයේ සිට පෙෂාවෝර් දක්වා වැටී ඇත.
2. බෝලාන් දූර්ගය - ඛයිබර් දූර්ගයට දකුණින සුලෙයිමාන් කඳුවලට බටහිර දිසාවෙන් පිහිටා ඇත.
3. මක්‍රාන් දූර්ගය - තිර්තාර් කඳු හා අරාබි මුහුද අතර පිහිටා ඇත.
4. හේරාත් දූර්ගය - ඇෆ්ගන් කඳු ආශ්‍රිතව ඉන්දු නිම්නය දක්වා වැටී ඇත.

* මෙම දූර්ග හරහා පැමිණි පිරිස් ඉන්දියාවේ පදිංචි වූ ආකාරය.
* විජාතික පිරිස් ඉන්දීය භූමිය තුළ දේශපාලන ස්ථාවරත්වයක් ගොඩනගා ගැනීම.
* ඉන්දියාවේ සිට ඉන්දියාවෙන් ඔබ්බට ඉන්දීය බලය පැතිරවීම.
* ඉන්දියාවේ ආගමික හා සංස්කෘතික වෙනස්වීම් කෙරෙහිද මේ දූර්ගවලින් පැමිණි අය බලපෑම් එල්ල කිරීම.
* ආර්ය සංක්‍රමණ නිසා යාග හෝම ඇතිවීම, දේව වන්දනය, ගිනි, ජල, වෘක්ෂ වැනි ස්වාභාවික වස්තූන් වන්දනා කිරීම ආදී ආගමික ලක්ෂණ ඉන්දියාවේ ව්‍යාප්ත විය.. ආදී ලෙස විස්තර කරන්න. (ල. 16)

09. **1. වෛදික ආර්යයන්ගේ ආගමික තත්වය.**

* ස්වභාව ධර්මයේ වස්තූන්ට බලවේගයන්ට දේවත්වයක් ආරෝපණය කිරීම.
* බහු දේව වාදී සංකල්පය ඉස්මතු වීම.
* දේව පිරිස් ප්‍රධාන කොටස් 3කට බෙදීම. ආකාශ, අන්තරීක්ෂ පෘථිවි එක් එක් දෙවියා ස්වභාව ධර්මයේ විවිධ අංග නියෝජනය කිරීම.
* ඉන්ද්‍ර, වරුණ, අග්නි, යම, සූර්ය, ඌෂා, සෝම ආදී වශයෙන්.
* බොහෝ දෙවිවරුන්ට පූජා කරන ජනප්‍රිය පූජා ද්‍රව්‍යයක් වූ සෝමපානය සෝම දෙවියා ලෙස වන්දනයට පාත්‍ර වීම.
* වෛදික දෙවිවරුන් පිදීමට ඍග් වේදයේ විවිධ ස්තෝත්‍ර ගීතිකා 1028කින් වැඩි ප්‍රමාණයක් ගොදා ගෙන තිබීම.
* යාඥය නම් වූ ආගමික කාර්ය ඉතා කුඩාවට 'ගෘහ යාග' ලෙස මෙකල ආරම්භ වීම.
* දෙවියන් හා මිනිසුන් සම්බන්ධ කළ අතරමැදි දෙවියා ලෙස අග්නි දෙවියා වැදගත් වීම.

**2. ගණ රාජ්‍යවල පරිපාලන ක්‍රමය :**

* මෙම රාජ්‍යවල පරිපාලන රටාවේ ලක්ෂණ බෞද්ධ මූලාශ්‍රවල දැක්වේ.
* මෙම රාජ්‍යවල පාලකයෝ බොහෝ ගණනක් ඇත. පාලනයේ ප්‍රධානීන් රාජා යන තනතුරු නාමයෙන් හැඳින්වීම.
* ලිච්ඡවී රාජ්‍යයේ රජවරු 7707 ක් ඇමතිවරු, යුවරජවරු 7707 ක් ආදී ලෙස සිටි බව බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වේ.
* සැම රජෙකුටම උප රජෙකු, සේනාධිපතියෙකු, භාණ්ඩාගාරික කෙනෙකු සිටි බව.
* රජවරු සියලු දෙනාම එකතු වී රාජ්‍ය පිළිබඳ සෑම ප්‍රශ්නයක්ම විවෘතව සාකච්ඡා කර විසඳ ගැනීම පාලන සභාවේ ප්‍රධාන ලක්ෂණ වීම.
* ලිච්ඡවී හු රැස්වූයේ විශාල නුවර සත්ථාගාර ශාලාවලය.
* මේ රාජ්‍යන්හි ශක්තියට පදනම වූයේ ඔවුන් ආරක්ෂා කරගෙන ආ සම්ප්‍රදායන්ය. ඒවා සප්ත අපරිහානීය ධර්ම නමින් හඳුන්වයි. සප්ත අපරිහානීය ධර්ම නම් කිරිම ආදී ලෙස විස්තර කරන්න.

**3. හරප්පා ශිෂ්ටාචාරයේ නගර සැලසුම් :**

* දියුනු නගර නිර්මාණයකින් තනා තිබීම.
* මෙහි පැරණිම නගරය හරප්පා වන අතර වඩාත් හොඳින් ආරක්ෂා වී ඇති නගරය මොහෙන්ජොදාරෝ නගරයයි. මෙම නගර දෙකේම වඩාත් කැපීපෙනෙන ලක්ෂණය මෙහි නගර සැලසුම් සහගතව ඉදිකර තිබීමයි.
* මෙහි නාගරික ලක්ෂණ පෙන්වන අංශ කිහිපයකි. නගර ඇතුළු නුවර හා පිටිනුවර වශයෙන් වෙන්කර ගත හැකි ලෙස ගොඩනැගිලි සාදා තිබුණි.
* නගරයට පිවිසීමේ මාර්ග පද්ධති ක්‍රමවත් විය.
* මෙම මාර්ග දෙපස නිවෙස් ඉදිකර තිබුණි. කුඩා හා විශාල නිවෙස් මෙන්ම මහල් නිවාසද දක්නට ලැබුණි.
* නගරයේ අපවිත්‍ර ජලය බැස යාමට කාණු පද්ධතියක් සකස් කර තිබීම.
* මාර්ග දෙපස ගෙවල්වල ප්‍රධාන දොරටුව අතුරු මාර්ගයකට මුහුණලා තැනූ බවත් දක්නට ලැබීම.
* නාන තටාක දක්නට ලැබීම.
* ධාන්‍යාගාර තිබූ බවට සාධක හමුවීම ආදී ලෙස විස්තර කරන්න.

**4. සිංදු ගංගා මිටියාවත.**

* සිංදු ගංගාව මුහුදට වැටෙන ප්‍රදේශ ඉතා සරුසාර ප්‍රදේශයක් වීම.
* මෙම ප්‍රදේශයේ තැනිතලා බිම දියළු පසින් යුක්ත වීම.
* සිංදු ගඟ අතු ගංගා කිහිපයකට බෙදී මුහුදට ගලායාම.
* සින්දු මිටියාවත යුද්ධ සංග්‍රාමවලදී වැදගත් වීම.
* සින්දු ගඟ ආශ්‍රිතව ආර්යයන්ගේ පදිංචි ස්ථාන වීම.
* මොහෙන්ජොදාරෝ, හරප්පා වගර 2 සිංදු ගඟ ආශ්‍රිතව පිහිටා තිබීම. ... ආදී ලෙස විස්තර කරන්න.

(එක් කොටසකට ලකුණු 8 බැගින් මුළු ලකුණු 16)